ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලයේ (ICCR) 75 වන පදනම් දිනය කොළඹ දී සැමරේ</u>

කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් 2024 අප්‍රේල් 29 වන දින සංස්කෘතික සබඳතා සඳහා ඉන්දියානු කවුන්සිලයේ 75 වන පදනම් දිනය කොළඹ විහාරමහාදේවි එළිමහන් රංග පීඨයේදී සමරන ලදී. සංස්කෘතික සුසංයෝගීතාවයේ සහ විශ්වීයත්වයේ අපූර්ව සිතුවමක් ගෙනහැර දක්වමින් මෙම වැඩසටහන ඉන්දීය සාම්ප්‍රදායික නර්තනයන්ගෙන් සහ සංගීත ඉදිරිපත්කිරීම් වලින් වර්ණවත් විය.

2. ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සමඟින් අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ද බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා ගෞරවනීය අමුත්තා ලෙස ද මෙම අවස්ථාව සමාරම්භ කිරීමට එක් වූහ. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් ජා මහතා වසර 75ක් පුරා ඉන්දියාවේ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවයේ කුළුණ ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් ICCR පවුල වෙත සිය සුභාශිංසන පළ කළේය. අමාත්‍ය ප්‍රේමජයන්ත මහතා ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාල සහ ආයතන 120කට අධික සංඛ්‍යාවක උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ට වාර්ෂිකව ශිෂ්‍යත්ව 200කට අධික සංඛ්‍යාවක් පිරිනැමීම සම්බන්ධයෙන් ICCR වෙත සිය කෘතවේදිත්වය පළ කළේය.

3. මෙම වැඩසටහනේදී මහ කොමසාරිස්තුමා, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ බුද්ධ ශාසන, ආගමික සහ

සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා විසින් දෙවන වරටත් පැවැත්වූ ප්‍රතිභා සංගම් තරඟයන්හි ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග පිරිනමන ලදී. 75 වන ඉන්දීය නිදහස් දිනය නිමිත්තෙන් ICCR විසින් සංවිධානය කරන ලද ප්‍රතිභා සංගම් තරඟාවලිය විසින් විදේශිකයන් සහ විදෙස්ගත ඉන්දියානුවන් විසින් ඉන්දීය සාම්ප්‍රදායික කලා ශෛලීන්ට ලබාදෙන අමිල දායකත්වය ඉස්මතු කරන ලදී.

4. ICCR ඉන්දියාවේ ප්‍රථම අධ්‍යාපන අමාත්‍යවරයා වන මවුලානා අබුල් කලාම් අසාද් මහතා විසින් 1950 වර්ෂයේදී පිහිටුවන ලදී. ICCR හි 75 වන පදනම් දිනය ඉන්දියාව සහ ලෝකය අතර අවබෝධය, හොඳහිත සහ සහයෝගීතාවය ප්‍රවර්ධනය කරමින් අනුපමේය මෙහෙයක් ඉටුකළ ආයතනයක විශිෂ්ට 75 වසරක් සමරයි. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය යටතේ පවතින ශ්‍රී ලංකාවේ ICCR මධ්‍යස්ථානය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය ද මේ වන විට වසර 25ක් සම්පූර්ණ කර තිබේ. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර අචල මිත්‍රත්වයේ සාක්ෂියක් ලෙස පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය සංස්කෘතික හුවමාරු, අගය කිරීම් සහ සංවාද සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරයි.

***

කොළඹ
2024 අප්‍රේල් 30